# ජිනීවා සාකච්ඡාවල ප්‍රතිඵලය

පිනිවා සාකච්ඡා සාර්ථක වූ බව පැවසීමට ආණ්ඩුවේ ජනමාධ්‍ය උත්සාහ ගනු පෙනෙයි. එහෙත් සිදුවී ඇත්තේ කුමක් ද? කොටි සංවිධානය සමග කරන සාකච්ඡාවලින් බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද? විශේෂයෙන්ම සුදු කොටි යැයි ඇතැමුන් විසින් හඳුන්වනු ලැබූ නෝර්වේ මැදිහත්වීමෙන් හෝ පහසුකම් සැපයීමෙන් හෝ කෙරෙන සාකච්ඡාවලින් බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද? ආණ්ඩුවට මහින්ද චින්තන අමතක කිරීමට හේතුවූ කරුණු කවරේද?

මහින්ද චින්තන අනුව කොටි සමග සාකච්ඡා කිරීමට පෙර ඔවුන් නිරායුධ කළ යුතු විය. එමෙන්ම කොටි බෙදුම්වාදය ප්‍රතික්ෂේප කළ යුතු විය. එහෙත් ආණ්ඩුවේ නියෝජිතයන් ජිනීවා ගියේ ඒ එකක් හෝ කිරීමෙන් පසුව නොවෙයි. ඇතැමුන්ට අනුව මහින්ද චින්තන යනු ප්‍රෝඩාවකි. එහෙත් අපි එසේ නොසිතමු. ජනතාව ඡන්දය දුන්නේ මහින්ද චින්තනවලට මිස මහින්ද රාජපක්ෂ මහතාට නොවෙයි. ඒ 1956 දී ජනතාව බෞද්ධ කොමිසම් සභාවේ වාර්තාවට ඡන්දය දුන්නාක් මෙනි. එදා ජනතාව ඡන්දය දුන්නේ සිංහල භාෂාව රජයේ භාෂාව බවට පත්කිරීමටය. එහෙත් මෙරට හා පිටරට විජාතික බලවේග සිංහල භාෂාව රජයේ භාෂාව බවට පත් නොකිරීමට වගබලා ගත්හ. අද ද බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය ඇතුළු විජාතික බලවේග මහින්ද චින්තන ක්‍රියාත්මක කිරීමට විරුද්ධව කටයුතු කරනු දැකිය හැකිය.

මහින්ද චින්තනවලට පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකටත් වඩා බලයක් ඇතැයි අපි තර්ක කරමු. පාර්ලිමේන්තුවේ පනතක් සම්මත කෙරෙන්නේ ජනතාවගේ නියෝජිතයන්ගේ මාර්ගයෙන්ය. ඒ වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයකි. මහින්ද චින්තන අනුමත කෙරුණේ රටේ මුළුමහත් ජනතාවගේ වැඩි ඡන්දයකින්ය. ඒ ඍජු ප්‍රජාතන්ත්‍රවාදයකි. මහින්ද චින්තන ක්‍රියාත්මක කිරීම සඳහා ජනතාව විසින් මහින්ද රාජපක්ෂ මහතාට ජනාධිපති තනතුර භාරකෙරී ඇත. එතුමා ජනාධිපති ධුරයේ භාරකාරත්වය දරන්නේ මහජනතාව ඒ පිළිබඳ එකඟත්වය පළකරන තුරු පමණය. බටහිර වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයෙහි තම නියෝජිතයන් ආපසු කැඳවීමේ වරමක් ජනතාවට හිමි නොවන බැවින් භාරකාරත්වයට පත්වූ පසු අවුරුදු හයක් වැනි දීර්ඝ කාලයක් එහි රැඳී සිටීමේ අවස්ථාව ඕනෑම ජනාධිපතිවරයකුට හිමිවෙයි. එහෙත් අද සිදුවෙමින් පවතින දෙයට ජනතාවගේ කැමැත්තක් ඇතැයි සිතිය නොහැකිය. ආණ්ඩුවේ වන්දිභට්ඨ ජනමාධ්‍යවලට ස්තෝත්‍ර ගැයීමට ඉඩකඩ තිබුණද ඉන් රටට වන සෙතක් නොමැත.

මහින්ද චින්තනවලට අනුව ඊනියා සටන් විරාම ගිවිසුම හෙවත් රනිල් ප්‍රභාකරන් ගිවිසුම නීති විරෝධීය. එය රටේ ස්වෛරීභාවයට තර්ජනයකි. ඒ සංශෝධනය කළ යුතු යැයි මහින්ද චින්තන වේදිකාවෙහි පැවසිණි. එහෙත් ජිනීවා සාකච්ඡාවලදී රනිල් ප්‍රභාකරන් ගිවිසුම (මෙ ගිවිසුම එලෙස හැඳින්වීම සුදුසුය.) සංශෝධනය නොවිණි. ඒ සංශෝධනය කළ යුතු යැයි නිමල් සිරිපාල ද සිල්වා මහතා කියා සිටි අවස්ථාවෙහි ඇන්ටන් බාලසිංහම් නම් ත්‍රස්තවාදියා සාකච්ඡාවලින් ඉවත් වන බවට තර්ජනය කර ඇත. ඔහු එසේ තර්ජනය කර ඇත්තේ ඔහුට හෝ කොටි සංවිධානයට ඇති ශක්තියක් නිසා නොව බටහිරයන් ඔහු පිටුපස සිටින බැවින්ය. ඒ තර්ජනය හමුවේ ආණ්ඩුවේ නියෝජිතයන් කර ඇත්තේ මහින්ද චින්තන හකුළා ගැනීමය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුව මෙන්ම මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවද රනිල් ප්‍රභාකරන් ගිවිසුම පිළිගෙන ඇත.

අද ආණ්ඩුව කීමට තැත් කරන්නේ රනිල් ප්‍රභාකරන් ගිවිසුම නීත්‍යනුකූල නොවූවත් රටේ ජනතාවට හිරිහැරවීම වැළැක්වීම සඳහා එහි අඩංගු කරුණු පිළිගන්නා බවය. රටේ ස්වෛරීභාවයට තර්ජනයක් වූ ගිවිසුමක අඩංගු කරුණු කිසිම හේතුවක් නිසා හෝ පිළිගැනීමට වගකිවයුතු ආණ්ඩුවකට නොහැකිය. ආණ්ඩුවක පළමු හා ප්‍රධාන කාර්යය වනුයේ රාජ්‍යයේ ස්වෛරීභාවය රැකීමය. රාජ්‍යයේ ස්වෛරීභාවයට තර්ජනයක් වූ ගිවිසුමක් නීත්‍යනුකූල නොවේ යැයි කියමින් එහි අඩංගු දෑ ක්‍රියාත්මක කිරීම ආදා මාළු ඉරටෙන් කෑමක් පමණකි. මේ මුළුමණින්ම බටහිරයන්ට යටවීම නිසා සිදුවන්නකි. මෙවර කොටි සමග සාකච්ඡා සඳහා ගිය කණ්ඩායමට පසුගිය

© Prof. Nalin De Silva

වතාවල ගිය කණ්ඩායම්වලට වඩා තරමක ශක්තියක් තිබී ඇති බව පැහැදිලිය. පසුගිය වතාවල සාකච්ඡා වෙනුවට බ්‍රිතාන්‍යයින්ගෙන් රැකවරණ ලබන ඇන්ටන් බාලසිංහම් නම් ත්‍රස්තවාදියාගේ කතා පැවැත්විණි. ආණ්ඩුවේ නියෝජිතයෝ ඔහු පැවැත්වූ කතා අසා සිටියහ. ආණ්ඩුවේ ජනමාධ්‍ය එසේ කතා ඇසීමට ගිය අය පිළිබඳවද ස්තෝත්‍ර ගැයූහ. මෙවර යම් සාකච්ඡාවක් තිබී ඇති බව පැහැදිලිය. එහෙත් බාලසිංහම් නම් ත්‍රස්තවාදියාගේ එක් තර්ජනයක් මැද ආණ්ඩුවේ ශක්තිය දියවී ගොස් ඇත.

කොටි දී ඇති ඊනියා පොරොන්දු ගැනද අද කියැවෙයි. විශේෂයෙන්ම ළමයින් ත්‍රස්තවාදයට එක්කර නොගන්නා බවට ඔවුන් පොරොන්දු වී ඇතැයි කියැවෙයි. කොටි මේ පොරොන්දුව දුන්නේ නිමල් සිරිපාල ද සිල්වා මහතාට හා කණ්ඩායමේ අනෙක් අයට පමණක් නොවෙයි. ඔලාරා ඔටුනු නමැත්තකුද එක්සත් ජාතීන්ගේ ළමා කටයුතු පිළිබඳ සංවිධානය වෙනුවෙන් මේ පොරොන්දුව වන්නියට ගෙස් ලබා ගත්තා අපට මතකය. ඒ පොරොන්දුව ගත් ඔලාරා ඔටුනු නම් අප්‍රිකානුවා ආගිය අතක් නැත. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි හා එයට අනුබද්ධ ආයතනවල දහස් ගණන් ප්‍රභූ ආසියාතිකයෝ හා අප්‍රිකානුවෝ බටහිර ක්‍රිස්තියානි රටවලට බැළ මෙහෙවරකම් කරති. ඒ බැළයන්ට ගෙවීම් කෙරෙන්නේ ඩොලර්වලින්ය. සමස්තයක් ලෙස ගත්කල මේ ප්‍රභූ බැලයන් ගෙන් ආසියාවට හෝ අප්‍රිකාවට හෝ වන සෙතක් නැත. වන එකම සෙත බැලයන්ගේ විදේශ බැංකු ගිණුම් තරවීම පමණකි. ඔටුනුට දුන් බොරු පොරොන්දුව වැනි පොරොන්දුවක් කොටින්ගෙන් ලබාගැනීම පිළිබඳව නිමල් සිරිපාල ද සිල්වා මහතාට අප කළ යුත්තේ අනුකම්පා කිරීමද? එසේත් නැතහොත් සිනහසීමද? ඒ කෙසේ වෙතත් සියල්ලෙන්ම පැහැදිලි වන්නේ බටහිරයන් අප පාලනය කරන ප්‍රමාණයය. අද අපට බටහිරයන් කියන්නේ කෙසේ හෝ කිනම් වන්දියක් ගෙවා හෝ ඊනියා සාමය ඇතිකරන ලෙසය. ඒ සඳහා මෙරට ප්‍රචාරක කටයුතු කිරීමට බටහිරයන් ගෙන් වැටුප් ලබන ඊනියා රාජ්‍ය නොවන සංවිධාන හා එහි සේවකයෝ වෙති. ඊනියා සාමයක් සඳහා පාවඩ එළීම මේ බැලයන්ගේ කාර්යය වෙයි. ඔටුනුලාට පමණට නොගෙවුවද මේ බැලයන්ට ද යම් මුදලක් බහිර ක්‍රිස්තියානි රටවලින් ලැබෙයි. මේ බැල සංවිධාන බොහොමයක් ක්‍රිස්තියානි වීමෙන් හා එහි සේවක බැලයන් ගෙන් විශාල පිරිසක් එක්කෝ ක්‍රිස්තියානි හෝ විශ්‍රාමලත් මාක්ස්වාදීන් හෝ වීමෙන් සිදු වන්නේ කුමක්ද යන්න පිළිබඳව යම් වටහාගැනීමක් ලබා ගැනීමටද හැකිවෙයි.

රනිල් ප්‍රභාකරන් ගිවිසුමෙන් සිදු වුයේ ආණ්ඩුව හා කොටි සංවිධානය සමාන කිරීමත්, රජයේ හමුදා හා කොටි ත්‍රස්තවාදීන් සමාන මට්ටමක ලා සැලකීමත් බව අපි කිහිප වරක්ම කියා ඇත්තෙමු. ඒ හේතුව නිසාම වුවද ගිවිසුම රටේ ස්වෛරීභාවයට තර්ජනයක් වෙයි. මහින්ද චින්තනවල ද ඒ පිළිගැනෙයි. රටේ මහජනතාවගේ බහුතරය, විශේෂයෙන් ම සිංහල ජනතාවගෙන් අතිමහත් බහුතරය ඒ බව පිළිගෙන ඇත. එහෙත් බාලසිංහම් නම් ත්‍රස්තවාදියාට ඒ පිළිගැනීම සියල්ල වචන කිහිපයකින් ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව ලැබී ඇත. ඔහු සාකච්ඡාවෙන් නැගිට ගියේ නම් සාමයට විරුද්ධව වැඩකිරීම ගැන බටහිර ක්‍රිස්තියානි රාජ්‍යයද ඔවුන්ගෙන් වැටුප් ලබන මෙරට ඊනියා සාම විගඩමුන්ද, ආණ්ඩුවට චෝදනා කිරීමට තිබුණි. ඒ කිසිවකු සාකච්ඡා බිඳ දැමීම පිළිබඳව බාලසිංහම්ට හා කොටින්ට චෝදනා නොකරනු ඇත. ඊනියා සාමයක් සඳහා ඕනෑම වන්දියක් ගෙවීමට සිදු වී ඇත්තේ ආණ්ඩුවටය. අද ආණ්ඩුව ඊනියා සාමය සඳහා රටේ ස්වෛරීභාවය උගස් කර ඇත.

කොටි තමන්ට අවශ්‍ය සියල්ල ක්‍රිස්තියානි නූතනත්වයේ බටහිර රටවල්වල ආධාරයෙන් සාකච්ඡාවල දී ලබාගෙන ඇත. රනිල් ප්‍රභාකරන් ගිවිසුම අනුව රජයේ හමුදා හා එක මට්ටමින් සැලකෙන කොටි ත්‍රස්තවාදීහු නිරායුධ නොකෙරෙති. එහෙත් කරුණා පාර්ශ්වය නිරායුධ කළ යුතුය. මෙරට සාම බහුබූතයන් විසින් අනභිබවනීය සංවිධානයක් ලෙස හැඳින්වෙන කොටි සංවිධානයට තනිවම කරුණා පාර්ශ්වය නිරායුධ කළ නොහැකිය. කොටින්ට නැගෙනහිර පළාතේ ඇති ශක්තිය එබඳුය. ඔවුන්ට අවශ්‍ය ආණ්ඩුව ලවා කරුණා පාර්ශ්වය නිරායුධ කිරීමය. සාකච්ඡා අවසානයේ නිකුත් කරන ලද නිවේදනයෙහි ඊනියා පරා-හමුදා (පැරා මිලිටරි ෆෝසස්) ගැන සඳහන් නොකිරීම ආණ්ඩුවේ ජයග්‍රහණයක් ලෙස හැඳින්වීමට උත්සාහයක් ගැනෙනු පෙනෙයි. මේ අල්ලෙන් විළි වසා ගැනීමට තැත් කිරීමකි. මහින්ද චින්තනවල සඳහන් පරිදි ආණ්ඩුව කළ යුත්තේ අවි බිම තැබීමෙන් තොරව කොටි සමග සාකච්ඡා නොපවත්වන බව ප්‍රකාශ කිරීමය.

මහජනයා මහින්ද චින්තනවලට ඡන්දය දුන්නේ අඟවල් අඟවල් දේශපාලන පක්ෂ ඒ සඳහා ප්‍රචාරක කටයුතු කළ නිසා නොවෙයි. මේ දේශපාලන පක්ෂ බොහොමයක් ජාතික මතවාදවලට එළඹී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම මහජනයා

එතැන සිටින බැවින්ය. අද ජාතික මතවාදවලට ඉල්ලුමක් ඇතැයි ඇතැම් අවස්ථාවාදීන් ප්‍රකාශ කළේ අද ඊයේ නොවෙයි. ඊනියා සාමයක් සඳහා කිනම් හෝ වන්දියක් ගෙවිය යුතුය යන බටහිර ක්‍රිස්තියානි මතවාදය මුළුමනින්ම පරාජය නොකර කොටි පරාජය කළ හැකි නොවෙයි. අද අවශ්‍ය රටේ ස්වෛරීභාවය මිස ඊනියා සාමයක් නොවෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva